සවියෙන් පෙරට - අපි එකට
e-ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂය | වාරය | පාඩම |
| --- | --- | --- | --- |
| 7 | ඉතිහාසය | 1 | 2. I කොටස - මානවම්ම රජ පෙළපත |



සැකසුම: දිනූෂා සමරවීර
බප/ හො/පලන්නොරුව ම. ම .වි.

# මානවම්ම රාජ්‍ය සමයට පෙර ලංකාවේ දේශපාලන තත්ත්වය

- මානවම්ම රජ පෙළපත බලයට පත්වීමට පෙර ලංකාවේ රජ කළේ, ලම්බකර්ණ හා මෞර්ය රාජ වංශිකයන්ය.
- මානවම්ම රජු බලයට පත්වීමට වසර 50 කට පෙර එම රාජ වංශිකයන් අතර ගැටුම් පැවතුණ
- ඒ කාලයේ මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ දක්නට ලැබුණු ලක්ෂණ

රටේ ස්ථාවර පාලනයක් බිහි නොවීම

සටන් සඳහා රටේ සම්පත් විශාල ලෙස විනාශ වීම

රාජ්‍ය බලය ලබාගැනීමට සටන් කිරීම සඳහා දකුණු ඉන්දියානු හමුදා මෙරටට ගෙන්වීම

රටේ ආර්ථික පරිහානියක් ඇතිවීම

# මානවම්ම රජතුමා

- මානවම්ම රජුගේ පියා දෙවන කස්සප රජතුමාය.
- දෙවන කස්සප රජුගේ මරණයෙන් පසු බලයට පත්වූයේ දෙවන දාඨෝපතිස්ස රජතුමාය.
- මානවම්ම කුමරු ආරක්ෂාව පතා පලා ගියේ ඉන්දියාවේ පල්ලව රාජධානියේ නරසිංහවර්මන් රජු වෙතටය.
- වසර 20 කට වැඩි කාලයක් පල්ලව රාජ්‍යයේ ගතකර මානවම්ම රජු ක්‍රි . ව. 684 දී හත්ථදාඨ රජු පරාජයට පත් කර බලයට පත්වූයේය.
- මෙතුමාගේ රාජ්‍ය පාලන කාලය වසර 35 කි.
- එතුමාගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ

    i) අධිෂ්ඨානශීලී බව

    ii) ඉවසිලිවන්තව කටයුතු කිරීම

# පළමුවන සේන රජතුමා

- පළමුවන සේන රජුගේ පියා දෙවන දප්පුල රජතුමාය.

දෙවන දප්පුල රජතුමා

↓

නවවන අග්ගබෝධි රජතුමා

↓

පළමුවන සේන රජතුමා

- පළමුවන සේන රජු බලයට පත්වූයේ ක්‍රි ව 833 දීය.
- ඔහුගේ පාලන කාලයේදී ශ්‍රී මාර ශ්‍රී වල්ලභ ලංකාව ආක්‍රමණය කළේය.

- පළමුවන සේන රජු සමග සටන් බිමට ගොස් මියගිය කුමාරවරු දෙදෙනා

  **මහින්ද කුමාරයා**

  **කස්සප කුමාරයා**

- පාණ්ඩ්‍ය ආක්‍රමණයෙන් පසු පළමුවන සේන රජු හා පාණ්ඩ්‍ය රජු අතර සාම ගිවිසුමක් ඇතිවිය.

- එතුමා විසින් කළ සේවාවන්:

  **i) ආක්‍රමණිකයන් අතින් විනාශ වූ ප්‍රදේශ යථා තත්ත්වයට පත් කිරීම**

  **ii) රිටිගල ආරාමය ,ජේතවනාරාමය ,අභයගිරිය වැනි විහාරාරාම ආශ්‍රිතව නව ඉදිකිරීම් කරවීම**



# දෙවන සේන රජතුමා

- දෙවන සේන රජුගේ පියා **කස්සප** ආදිපාදවරයාය.
- මෙතුමාගේ රාජ්‍ය කාලයේ කැපී පෙනෙන සිදුවීමකි පාණ්ඩ්‍ය රාජධානිය ආක්‍රමණය කිරීම.
- දෙවන සේන රජු පාණ්ඩ්‍ය රාජධානිය ආක්‍රමණය කළේ පාණ්ඩ්‍ය කුමරෙකු වූ **දෙවන වරගුණවර්මන්** කුමාරයාට සහය පිණිසය.
- එතුමා පාණ්ඩ්‍ය රාජධානිය ආක්‍රමණය සඳහා යැවූයේ **කුට්ඨක** සෙනෙවියාය.
- මෙහිදී මරණයට පත්වූයේ **ශ්‍රී මාර ශ්‍රී වල්ලභ** නම් පාණ්ඩ්‍ය රජතුමාය.
- කුට්ඨක සෙනෙවියා පිළිබඳ සඳහන් වන්නේ **ඉරිපින්නියාව** සෙල්ලිපියේය.

# දෙවන සේන රජතුමා විසින් කළ සේවාවන්

- පළමුවන සේන රජුගේ කාලයේදී විනාශ වූ සියල්ල නැවත පිළිසකර කිරීම.
- මිහින්තලේ රෝහලක් කරවීම.
- මිනිපේ නම් ප්‍රදේශයේ අමුණක් අලුත්වැඩියා කිරීම.
- මින්නේරිය වැවේ සොරොව්වක් තැනවීම.
- ශාසනික සේවා සිදුකිරීම.



# අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලන සංවිධානය

## මධ්‍ය පාලනය

රජු හා රජුට සහය වූ නිලධාරීන් පිරිසක් මගින් රට පුරා බලපැවැත්වෙන ලෙස සංවිධානය වී තිබූ පාලන තන්ත්‍රයයි

# අනුරාධපුර යුගයේදී රජකම උරුමවීමේ ක්‍රම


- පියාගෙන් පසු පුතාට
  - පණ්ඩුකාභය රජුගෙන් පසු මුටසීව කුමරාට
- වැඩිමහල් සහෝදරයාගෙන් පසු බාල සහෝදරයාට
  - දුටුගැමුණු රජුගෙන් පසු සද්ධාතිස්ස කුමරුට

# රජුට අයත් කාර්යයන්

- රටේ නීතිය හා සාමය පවත්වාගෙන යාම
- බාහිර හා අභ්‍යන්තර සතුරු උවදුරුවලින් රට ආරක්ෂා කරගැනීම
- මධ්‍ය පාලනයට හා ප්‍රාදේශීය පාලනයට අවශ්‍ය නිලධාරීන් පත් කිරීම
- රටේ ආර්ථික කටයුතු හැසිරවීම හා අයබදු පැනවීම
- අධිකරණ කටයුතු මෙහෙයවීම

# රජුට පාලන කටයුතුවලදී සහය වූ නිලධාරීන්

| තනතුර | කාර්යය |
|---|---|
| යුවරජ | අනාගත රජකම උරුම තැනැත්තා |
| සේනාපති | සේනාව මෙහෙයවීම |
| භාණ්ඩාගාරික | භාණ්ඩාගාර කටයුතු භාර තැනැත්තා |
| මහා ලේඛක | ලේඛන කටයුතු භාර ප්‍රධානියා |
| **අධ්‍යක්ෂ**<br>අශ්‍ව අදෙක<br>ඇති අදෙක | **කාර්යාංශ පිළිබඳ ප්‍රධානීන්**<br>අශ්වයන් පිළිබඳ කාර්යාංශයේ ප්‍රධානියා<br>ඇතුන් පිළිබඳ කාර්යාංශයේ ප්‍රධානියා |
| ඈපා | ආදිපාද |
| මාපා | මහාදිපාද |




- අගනුවරට බැහැරින් පිහිටි පරිපාලන ප්‍රදේශ **රුහුණු ,මායා** හා **පිහිටි** වේ.
- රටේ කුඩාම පරිපාලන ඒකකය වූයේ ගමයි.
- අනුරාධපුර මුල් යුගයේ ඔවුන් **ගමික** ලෙස හදුන්වා ඇත.
- අනුරාධපුර අවසාන යුගයේ ඔවුන් **ගම්ලද්දන්** ලෙස හදුන්වා ඇත .

# රාජ්‍ය ප්‍රතිපත්ති හා සමාජ ශුභසාධනය

රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී පහත කරුණු පිළිබඳ අවධානය යොමු කෙරිණි.

**i) රටේ ආරක්ෂාව සැලසීම**

**ii) නීතිය හා සාමය පවත්වාගෙන යාම**

**iii) ආර්ථික ශුභසිද්ධිය ඇති කිරීම**

**iv) ශාසනික අභිවෘද්ධිය ඇති කිරීම**

# රටේ ආරක්ෂාව සැලසීම

- රටේ ආරක්ෂාව සැලසීමේදී රජුට සහය වූ නිලධාරීන්

  **සේනාපති**

  **හමුදාව**

  **ප්‍රාදේශීය අධිපතියෝ**

- රජුගේ හමුදාව

  **ඇත්**

  **අස්**

  **රිය**

  **පාබල**



- නගර නිර්මාණයේදී ඒවායේ ආරක්ෂාව පිළිබද සැලකිලිමත් වීම.

  **නගර වටා ප්‍රාකාර ඉදිකිරීම**

  **වාසල් දොරටු හා ආරක්ෂක බලකොටු තැනවීම**

# නීතිය හා සාමය පවත්වාගෙන යාම

අතීත නීති පද්ධතිය තුළ පැවති නීති වර්ග

i) ඉඩම් භුක්තිය පිළිබඳ නීති


ii) වෙළෙඳාම පිළිබඳ නීති

iii) කෘෂිකර්මය හා බදු සම්බන්ධ නීති

iv) අපරාධ නීති

# වේවැල්කැටිය සෙල්ලිපිය

දසගම් පාලනයට හා අපරාධ නඩු විසදීමට අදාල නීති සදහන් වේ




## අන්තානි කණු

රාජකීය දීමනා පිළිබද සදහන් ශිලා ලිපි විශේෂයකි

# ආර්ථික ශුභසිද්ධිය

- වැව් හා වාරිමාර්ග තැනවීම.
- අය බදු පැනවීමේදී පෙර සිරිත අනුගමනය කිරීම.
  (කලින් රජවරු අනුගමනය කළ ප්‍රතිපත්තිය)
- **මිහින්තලේ පුවරු ලිපිය**

  i) මිහින්තලේ විහාරයේ භික්ෂූන් වහන්සේලා පිළිපැදිය යුතු සිරිත් විරිත් පිළිබඳ මෙහි සදහන් වේ.

  ii) මෙහිදී විහාරයේ අය වැය (ආදායම් හා වියදම්) පිළිබඳ දෛනිකව (දිනපතා) හා මාසිකව වාර්තා තබා වසර අවසානයේ අය වැය ලේඛනයක් පිළියෙල කරගනී.




# සමාජ ශුභසාධනය

| රජතුමා | කළ සේවාවන් |
| --- | --- |
| බුද්ධදාස රජතුමා | •සෑම ගම් 10 කටම වෛද්‍යවරයෙකු බැගින් පත්කිරීම |
| පළමුවන උපතිස්ස රජතුමා | •අන්ධයන් හා රෝගීන් සඳහා ආරෝග්‍යශාලා හා දානශාලා පිහිටුවීම |
| පළමුවන උදය රජතුමා | •පොළොන්නරුව හා පදවියේ ආරෝග්‍යශාලා පිහිටුවීම<br>•ඒවායේ නඩත්තුවට ගම් බිම් පිදීම |
| සිව්වන කස්සප රජතුමා | •වසංගත රෝගීන්ට සාත්තු කිරීමට ආරෝග්‍යශාලා තැනවීම<br>•නගරයේ වෛද්‍යහල් පිහිටුවීම |

# ශාසනික අභිවෘද්ධිය

- විහාරාරාම තැනවීම
- ඒවායේ නඩත්තුවට ගම් බිම් ප්‍රදානය කිරීම
- පිරිවෙන් පිහිටුවීම




# කලාපීය දේශපාලන ප්‍රවණතා හා විදේශ ප්‍රතිපත්තිය

ලංකාව කෙරෙහි බලපෑම් කළ දකුණු ඉන්දියානු රාජධානි



| රාජධානිය | පිහිටීම | අගනුවර |
| --- | --- | --- |
| පල්ලව | චෝල රාජ්‍යයට උතුරෙන් | කාංචිපුරය |
| පාණ්ඩ්‍ය | දකුණු ඉන්දියාවේ නැගෙනහිර වෙරළ ආසන්නයේ ලංකාවට ඉතා සමීපව | මදුරාපුරය |
| චෝල | පාණ්ඩ්‍ය රාජ්‍යයට උතුරෙන් දකුණු ඉන්දියානු වෙරළට ආසන්නව | තන්ජෝරය |

- පස්වන මිහිඳු රජුගේ කාලයේදී අනුරාධපුර පාලනය දුර්වල විය.
- අනුරාධපුර රාජධානිය බිදවැටුණේ රාජ රාජ හා රාජේන්ද්‍ර නම් චෝල ආක්‍රමණ නිසාවෙනි.
- පළමුවන රාජේන්ද්‍ර සමයේ චෝලයන් ලංකාවට පැමිණ පොළොන්නරුව තම අගනුවර කරගන්නා ලදී.
- ඔවුහු චෝල අධිරාජ්‍යයේ කොටසක් ලෙස රජරට ප්‍රදේශ පාලනය කළහ.
- අනුරාධපුර රාජධානිය බිද වැටුණේ **ක්‍රි .ව .1017 දීය.**



**සවියෙන් පෙරට - අපි එකට**

**e - ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | ඉතිහාසය | 1 | 2. I කොටස - මානවම්ම රජ පෙළපත -ඇගයීම |

**සැකසුම: දිනූෂා සමරවීර**

**බප/හො/පලන්නොරුව ම.ම.වි**

1. වසභ රජතුමා හා ධාතුසේන රජතුමා අයත්වන රජ පෙළපත් නම් කරන්න.
2. මානවම්ම රජතුමා බලයට පත්වීමට පෙර මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ දක්නට ලැබුණු කැපී පෙනෙන ලක්ෂණ මොනවාද?
3. මානවම්ම රජතුමාගේ පියා නම් කරන්න.
4. මානවම්ම කුමාරයා ආරක්ෂාව පතා පලා ගියේ ඉන්දියාවේ පල්ලව රාජධානියේ කුමන රජු වෙතද?
5. ක්‍රි .ව. 684 දී මානවම්ම කුමරු මෙරට බලය ලබාගත්තේ කුමන රජු පරාජය පත්කිරීමෙන්ද?
6. මානවම්ම රජතුමාගේ චරිතයෙන් ලබාගත හැකි ආදර්ශ මොනවාද?
7. පළමුවන සේන රජුගේ පියා නම් කරන්න.
8. ඔහුගේ පාලන කාලය තුළදී මෙරට ආක්‍රමණය කළ පාණ්ඩ්‍ය රජතුමා නම් කරන්න.
9. එම ආක්‍රමණය පරාජය කිරීම සඳහා වූ සටනේදී මියගිය කුමාරවරු දෙදෙනා නම් කරන්න.
10. පළමුවන සේන රජතුමා විසින් කළ සේවාවන් මොනවාද?
11. දෙවන සේන රජතුමාගේ පියා නම් කරන්න.
12. එතුමා විසින් කළ සේවාවන් මොනවාද?
13. දෙවන සේන රජතුමා විසින් පාණ්ඩ්‍ය රාජධානිය ආක්‍රමණය කළේ කුමන රජතුමාට සහය පිණිසද?
14. එතුමා විසින් පාණ්ඩ්‍ය දේශයට යවන ලද්දේ කුමන සෙනෙවියාද?
15. එම ආක්‍රමණයේදී මරණයට පත්වූ පාණ්ඩ්‍ය රජු නම් කරන්න?
16. කුට්ඨක සෙනෙවියා පිළිබඳව සඳහන් වන සෙල්ලිපිය කුමක්ද?

17. මධ්‍ය පාලනය යනු කුමක්ද?

18. අනුරාධපුර යුගයේදී පැවති රජකම උරුම වීමේ ප්‍රධාන ක්‍රම මොනවාද?

19. රජුට අයත් කාර්යයන් මොනවාද?

20. රාජ්‍ය පාලන කටයුතුවලදී රජුට සහය වූ නිලධාරීන් නම් කරන්න.

21. අනුරාධපුර යුගයේදී ප්‍රාදේශීය පාලනය සිදුවූ ආකාර මොනවාද?

22. අනුරාධපුර යුගයේ මුල් කාලයේ හා අවසාන කාලයේ ගම් පාලනය කළ අය හැඳින්වූ නම් මොනවාද?

23. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී රජවරු අවධානය යොමුකළ කරුණු මොනවාද?

24. චතුරංගනී සේනාව නම් කරන්න.

25. අතීත නීති පද්ධතිය තුළ පැවති නීති වර්ග මොනවාද?

26. වේවැල්කැටිය සෙල් ලිපියේ සඳහන් වන්නේ කුමන නීති පිළිබඳවද?

27. අන්තානි කණු යනු මොනවාද?

28. පෙර සිරිත යනු කුමක්ද?

29. මිහින්තලේ පුවරු ලිපිය යනු කුමක්ද?

30. අනුරාධපුර යුගයේදී සමාජ ශුභසාධනය පිළිබඳ උනන්දුවක් දැක්වූ රජවරු හා ඔවුන් විසින් ඉටුකළ සේවාවන් ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| රජතුමා | ඉටු කළ සේවය |
|---|---|
| | |
| | |
| | |
| | |

31. අතීත රජවරු ශාසනයේ දියුණුව වෙනුවෙන් කළ සේවාවන් මොනවාද?

32. අනුරාධපුර යුගය අවසන් කාලයේදී ලංකාවට බලපෑම් එල්ල කළ දකුණු ඉන්දියානු රාජධානි ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| රාජධානිය | පිහිටීම | අගනුවර |
|---|---|---|
| | | |
| | | |
| | | |

33. අනුරාධපුර රාජධානිය බිදවැටුණේ කුමන වසරේද?

34. එම රාජධානිය බිදවැටුණේ කුමන රජවරුන් එල්ල කළ ආක්‍රමණ නිසාද?

**සවියෙන් පෙරට - අපි එකට**

**e - ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | ඉතිහාසය | 1 | 2. I කොටස - මානවම්ම රජ පෙළපත - පිළිතුරු |

**සැකසුම: දිනූෂා සමරවීර**

**බප/හො/පලන්නොරුව ම.ම.වි**

1. වසභ රජතුමා - ලම්හකර්ණ

   ධාතුසේන රජතුමා - මෞර්ය

2. i) අභ්‍යන්තර ගැටුම් නිසා රටේ ස්ථාවර පාලනයක් බිහි නොවීම

   ii) සටන් සඳහා රටේ සම්පත් විශාල ලෙස විනාශ වීම

   iii) රාජ්‍ය බලය ලබාගැනීමට සටන් මෙහෙයවීම සඳහා දෙපාර්ශවයේම නායකයන් දකුණු ඉන්දියානු හමුදා මෙරටට ගෙන්වීම

   iv) රටේ ආර්ථික පරිහානියක් ඇතිවීම

3. දෙවන කස්සප රජතුමා
4. නරසිංහවර්මන් රජතුමා
5. හත්ථදාඨ රජතුමා
6. අධිෂ්ඨානශීලී බව හා විශ්වාසවන්ත බව
7. දෙවන දප්පුල රජතුමා
8. ශ්‍රී මාර ශ්‍රී වල්ලභ
9. මහින්ද කුමරු හා ආදිපාද කස්සප කුමරු
10. i) ආක්‍රමණිකයන් විනාශ කළ ප්‍රදේශ යළි යථා තත්ත්වයට පත්කිරීම

    ii) රිටිගල ආරාමය,ජේතවනාරාමය හා අභයගිරිය වැනි විහාරාරාම ආශ්‍රිතව නව ඉදිකිරීම් කරවීම

11. කස්සප ආදිපාදවරයා
12. i) ශාසනික දියුණුව සඳහා කටයුතු කිරීම

    ii) මිහින්තලේ රෝහලක් කරවීම

    iii) මිණිපේ නම් ප්‍රදේශයේ අමුණක් අලුත්වැඩියා කිරීම

    iv) මින්නේරිය වැවේ සොරොව්වක් තැනවීම

13. දෙවන වරගුණවර්මන් කුමාරයා

14. කුට්ඨක සෙනෙවියා

15. ශ්‍රී මාර ශ්‍රී වල්ලභ

16. ඉරිපින්නියාව සෙල්ලිපිය

17. රජු හා රජුට සහය වූ නිලධාරීන් පිරිසක් මගින් රට පුරා බල පැවැත්වෙන ලෙස සංවිධානය වී තිබූ පාලන තන්ත්‍රයකි.

18. i) පියාගෙන් පසුව පුතාට

ii) වැඩිමහල් සහෝදරයාගෙන් පසුව බාල සහෝදරයාට

19. i) රටේ නීතිය හා සාමය පවත්වාගෙන යාම

ii) බාහිර හා අභ්‍යන්තර සතුරු උවදුරුවලින් රට ආරක්ෂා කරගැනීම

iii) මධ්‍ය පාලනයට හා ප්‍රාදේශීය පාලනයට අවශ්‍ය නිලධාරීන් පත් කිරීම

iv) රටේ ආර්ථික කටයුතු හැසිරවීම හා අයබදු පැනවීම

v) අධිකරණ කටයුතු මෙහෙයවීම

20. i) යුවරජු

ii) සේනාපති

iii) භාණ්ඩාගාරික

iv) මහා ලේඛක

v) අධ්‍යක්ෂ

21. i) අනුරාධපුර නගරය හා ඒ අවට ප්‍රදේශ දිසා අනුව කොටස් වලට බෙදා කළ පාලනය

ii) රට යනුවෙන් හැඳින්වූ පාලන ප්‍රදේශ පැවතීම

iii) අගනුවරට බැහැරින් පිහිටි ප්‍රදේශ රුහුණු ,මායා හා පිහිටි වශයෙන් වෙන වෙනම පරිපාලන නිලධාරීන් යටතේ කළ පාලනය

22. අනුරාධපුර යුගයේ මුල් කාලයේ - ගමික

අවසාන කාලයේ - ගම්ලද්දන්

23. i) රටේ ආරක්ෂාව සැලසීම

ii) නීතිය හා සාමය පවත්වාගෙන යාම

iii) ආර්ථික ශුභසිද්ධිය ඇති කිරීම

iv) ශාසනික අභිවෘද්ධියට කටයුතු කිරීම

24. ඇත්,අස්,රිය,පාබල

25. i) ඉඩම් භුක්තිය පිළිබඳ නීති

ii) වෙළෙඳාම පිළිබඳ නීති

iii) කෘෂිකර්මය හා බදු සම්බන්ධ නීති

iv) අපරාධ නීති

26. දසගම් පාලනයට හා අපරාධ නඩු විසඳීමට අදාල නීති

27. රාජකීය දීමනා පිළිබඳ සදහන් ශිලා ලිපි

28. කලින් රජවරුවන් අනුගමනය කළ පිළිගත් ප්‍රතිපත්තිය

29. මිහින්තලේ විහාරයේ අභ්‍යන්තර පාලනය හා භික්ෂූන් වහන්සේලා පිළිපැදිය යුතු සිරිත් විරිත් පිළිබද

30.

| රජතුමා | ඉටු කළ සේවය |
|---|---|
| බුද්ධදාස රජතුමා | සෑම ගම් දහයකටම වෛද්‍යවරයෙකු බැගින් පත්කොට වෙදහල් කරවීම |
| පළමුවන උපතිස්ස රජතුමා | අන්ධයන් හා රෝගීන් සදහා ආරෝග්‍යශාලා හා දානශාලා පිහිටුවීම |
| පළමුවන උදය රජතුමා | පොළොන්නරුව හා පදවියේ ආරෝග්‍යශාලා හා පිහිටුවීම හා ඒවායේ නඩත්තුවට ගම්බිම් පිදීම |
| සිවුවන කස්සප රජතුමා | වසංගත රෝගීන්ට සාත්තුව පිණිස ආරෝග්‍යශාලා තනවා වෙදහල් පිහිටුවීම |

31. i) විහාරාරාම තැනවීම

ii) ඒවායේ නඩත්තුවට ගම්බිම් ප්‍රදානය කිරීම

iii) පිරිවෙන් පිහිටුවීම

32.

| රාජධානිය | පිහිටීම | අගනුවර |
|---|---|---|
| පල්ලව | දකුණු ඉන්දියාවේ චෝල රාජ්‍ය පැවති භූමියට උතුරෙන් | කාංචිපුරය |
| පාණ්ඩ්‍ය | දකුණු ඉන්දියාවේ නැගෙනහිර වෙරළ ආසන්නයේ | මදුරාපුරය |
| චෝල | පාණ්ඩ්‍ය රාජ්‍යයට උතුරෙන් දකුණු ඉන්දියානු නැගෙනහිර වෙරළට ආසන්නව | තන්ජෝරය |

33. ක්‍රි .ව.1017

34. රාජ රාජ හා රාජේන්ද්‍ර නම් චෝල රජවරුන් එල්ල කළ ආක්‍රමණ



සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | ඉතිහාසය | 2 | 2. IIකොටස<br>අපේ කීර්තිමත් රජවරු |

සැකසුම: තිළිණ වෙදගේ
වික්‍රමශීලා විද්‍යායතන පිරිවෙන

# අනුරාධපුර රාජධානිය බිඳ වැටීම

- අනුරාධපුර රාජධානියේ අවසාන පාලකයා වූයේ පස්වන මිහිඳු රජතුමාය.
- ක්‍රි.ව 1017 දී දකුණු ඉන්දියානු චෝල අධිරාජයා වූ I වන රාජේන්ද්‍ර චෝල විසින් අනුරාධපුරය ආක්‍රමණය කර යටත් කරගත්තේය.
- මෙම ආක්‍රමණය අවස්ථාවේ දී පස්වන මිහිඳු රජතුමාව සිරකරුවෙකු ලෙස චෝල දේශයට ගෙන යන ලදී.
- ක්‍රි.ව 1029 දී සිරකරුවෙකු ලෙස සිටි මිහිඳු රජතුමා චෝල දේශයේ දී මරණයට පත්වීමත් සමඟ රුහුණු රට මුල් කරගනිමින් චෝල විරෝධී සටන් ව්‍යාපාරය ආරම්භ විය.
- ක්‍රි.ව 1017 සිට ක්‍රි.ව 1070 දක්වා චෝලයන් විසින් රජරට ප්‍රදේශය පාලනය කරන ලදී.

# රුහුණේ ඇති වූ චෝල විරෝධී සටන් මර්දනය කිරීම සඳහා චෝලයන් අනුගමනය කළ උපාය මාර්ග

- පොළොන්නරුවේ සිට වරින් වර රුහුණු ප්‍රදේශය ආක්‍රමණය කර එම ප්‍රදේශයේ සම්පත් විනාශ කිරීම.
- රාජ්‍යත්වය උරුම කුමාරවරුන් ඝාතනය කිරිම.

# පොළොන්නරු රාජධානිය



# පොළොන්නරු රාජධානියේ ශ්‍රේෂ්ඨ පාලකයන් තිදෙනා

- මහා විජයබාහු රජතුමා ( ක්‍රි.ව 1055 – 1110 )
- මහා පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව 1153 – 1186)
- නිශ්ශංකමල්ල රජතුමා (ක්‍රි.ව 1187 -1196)

# මහා විජයබාහු රජතුමා ( ක්‍රි.ව 1055 – 1110 )



# මහා විජයබාහු රජතුමා පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර

- මහා වංශය (චූලවංශය)
- පනාකඩුව තඹ සන්නස
- අඹගමුව ශිලා ලිපිය

# මහා විජයබාහු රජතුමාගේ මව්පියන්

**මහාසාමි මොග්ගල්ලාන (පියා)**

**ලෝකිතා දේවිය (මව)**

**මහා විජයබාහු (කිත්ති කුමරු)**

# පළමුවන විජයබාහු රජතුමා රුහුණේ බලය තහවුරු කරගැනීම

- චෝල පාලනයෙන් අනුරාධපුරය මුදා ගැනීම සඳහා ප්‍රථමයෙන් රුහුණු රට එක්සත් කළ යුතු බව කිත්ති කුමරුට අවබෝධ විය.

- රුහුණේ බලය තහවුරු කරගැනීම සඳහා කිත්ති කුමරුට බුද්ධ රාජ හෙවත් සිත්නරුබිම් බුදල්නා නම් ප්‍රභූවරයාගේ ද සහය හිමිවිය.

- ක්‍රි.ව 1055 දී රුහුණේ පාලකයා වූ කේෂධාතු කාශ්‍යප බලයෙන් පහකරමින් කිත්ති කුමරු I වන විජයබාහු නමින් රුහුණේ බලයට පත් විය.

# චෝල බලයෙන් ලක්දිව මුදා ගැනීම සඳහා විජයබාහු රජතුමා ගත් පළමු උත්සාහය

- I විජයබාහු රජතුමා රුහුණේ බලයට පත් වී ඉතා කෙටි කාලයක දී චෝලයන් රුහුණ ආක්‍රමණය කළේය.
- මෙතුමාගේ බලය රුහුණේ ස්ථාවර වීමට පෙර ඔහු විනාශ කිරීම මෙම ආක්‍රමණයේ අරමුණ විය.
- චෝලයන්ගේ අරමුණ වහා තේරුම්ගත් රජතුමා මලය දේශය වෙත උපක්‍රමශීලීව පසුබසින ලදී.
- මේ අවස්ථාවේ දී චෝලයන්ගේ අරමුණ ඉටු නොවූ බැවින් රුහුණ කොල්ලකා පොළොන්නරුව වෙත ආපසු ගියේය.

# චෝල බලයෙන් ලක්දිව මුදා ගැනීම සඳහා විජයබාහු රජතුමා ගත් දෙවන උත්සාහය

- චෝලයන්ගේ පළමු ආක්‍රමණයෙන් අධෛර්ය නොවී විජයබාහු රජතුමා රෝහණය කේන්ද්‍ර කරගනිමින් නැවතත් චෝල විරෝධී සටන සඳහා සූදානම් විය.
- මෙම සටන සඳහා ආධාර ලබා ගැනීමේ අරමුණින් විජයබාහු රජතුමා  බුරුම රජතුමා සමඟ මිත්‍රත්වයක් ගොඩනඟා ගත්හ.
- රෝහණයේ යුධ උණුසුම වැඩිවන විට රජරට වැසියන් චෝලයන්ට බදු ගෙවීම නවතමින් සටනට සහය විය.
- මව් දේශයෙන් උපකාරක හමුදා ගෙන්වා ගත්  චෝලයන් පොළොන්නරුවේ සිට නැවතත් රෝහණය ආක්‍රමණය කළේය.
- මේ අවස්ථාවේ දී  චෝල හමුදාව පරාජය කළ විජයබා රජතුමා සිය හමුදා මෙහෙයවා පොළොන්නරුවට පහර දී යටත් කරගත්තේය.
- විජයබාහු රජතුමා පොළොන්නරුව අල්ලාගත් බව දැනගත් චෝල අධිරාජ්‍යයා නැවතත් ශක්තිමත් හමුදාවක් එවා පොළොන්නරුවට දැඩි ප්‍රහාරයක් එල්ල කළේය.
- එම ප්‍රහාරය හමුවේ පරාජයට පත් වූ විජයබාහු රජතුමා ආරක්ෂාව පතා කැගලු දිසාවේ වාකිරිගලට පසුබසින ලදී.

# කෑගලු දිසාවේ වාකිරිගල බලකොටුව



# චෝල බලයෙන් ලක්දිව මුදා ගැනීම

- ක්‍රි.ව 1070 දී මහානාගහුල කේන්ද්‍රකර ගනිමින් චෝල බලය මුලිනුපුටා දැමීමේ අවසාන සටන සඳහා විජයබාහු රජතුමා සූදානම් විය.
- මෙම සටන සඳහා ප්‍රධාන සේනාංක දෙකක් යොදා ගනු ලැබීය.
- ඉන් එක් සේනාංකයක් ඉන්දියාවෙන් පැමිණෙන උපකාරක හමුදා නැවැත්වීමේ අරමුණින් මහාතිත්ත වරාය දක්වා ගොස් රැකවල් යෙදුවේය.
- අනෙක් සේනාව විජයබාහු රජතුමාගේ නායකත්වයෙන් පොළොන්නරුව දක්වා ගමන්කොට ප්‍රබල සටනකින් අනතුරුව එය යටත් කරගත්තේය.
- වසර 70 ක් පැවති චෝල පාලනයෙන් ලක්දිව මුදා ගැනීමට ක්‍රි.ව 1070 දී I විජයබාහු රජතුමා සමත් විය.

# මහා විජයබාහු රජතුමාගෙන් සිදු වූ සේවාව

- විදේශීය ආක්‍රමණිකයන්ගෙන් රට මුදා ගැනීම.
- පොළොන්නරුව යටතේ ලක්දිව එක්සේසත් කිරීම.
- පොළොන්නරු රාජධානියේ ආරම්භක පාලකයා වීම.
- ඇපා, මාපා තනතුරු ඇතිකොට පරිපාලනය විධිමත් කිරීම.
- වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කරමින් ආර්ථිකය ශක්තිමත් කිරීම.
- අනුරාධපුරයේ රාජ මාලිගාවක් නිර්මාණය කිරීම.

# මහා විජයබාහු රජතුමා අනුරාධපුරයේ ඉදිකළ රාජ මාලිගාව



# මහා විජයබාහු රජතුමාගේ විදේශ ප්‍රතිපත්තියේ විශේෂ ලක්ෂණ

- චෝල ආක්‍රමණයක් නැවත ඇතිවීම වැළැක්වීමේ අරමුණින් අවට රටවල් සමඟ වෙළඳ සබඳතා ගොඩනඟා ගැනීම.
- ආර්ථික සහ ශාසනික උන්නතිය උදෙසා බුරුමය සමඟ සබඳතා ගොඩනඟා ගැනීම.
- බටහිර චාලුක රජයට තෑගිබෝග සහ දූතයන් යවා මිත්‍රත්වයක් ගොඩනඟා ගැනීම.
- චෝල විරෝධී රාජ්‍යයන් සමඟ විවාහ සම්බන්දතා ඇතිකර ගැනීම.

උදා - මිත්තා කුමරිය පාණ්ඩ්‍ය වංශික කුමාරයෙක් විවාහ කරගැනීම.

විජයබාහු රජතුමා තිලෝක සුන්දරි නම් කාලිංග වාංශික කුමරියක් විවාහ කරගැනීම.

# I වන විජයබාහු රජතුමාගෙන් සිදු වූ ආගමික සේවය

- බුරුම රටින් භික්ෂූන් වැඩමවා උපසම්පදාව යළි පිහිටුවීම.
- පොළොන්නරුවේ තෙමහල් දළදා මන්දිරයක් ගොඩනැගීම.
- ශ්‍රී පාදස්ථානයට යන මාර්ගය ප්‍රතිසංස්කරණය කරවා එම ස්ථානයට ගම් බිම් පිදීම.
- අනුරාධපුරයේ සහ රුහුණේ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.

# විජයබාහු රජතුමා පොළොන්නරුවේ ඉදිකල තෙමහල් දළදා මන්දිරය (අටදාගෙය)



# I විජයබාහු රජතුමාගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ

- අවංකකම
- කෘතගුණ සැලකීම
- නොපසුබස්නා වීර්යය
- මව්බිමට ඇති ලැදියාව

# පනාකඩුව තඹ සන්නස





විජයබාහු රජතුමාගේ කුඩාකාලය පිළිබඳව සහ සිත්නරුබිම් බුදල්නාව සෙනවියාට ලබාදුන් ගම්වරයක් පිළිබඳව මෙම ලිපියේ තොරතුරු දැක්වේ

# අඹගමුව ශිලා ලිපිය

අඹගමුව සෙල්ලිපියේ දැක්වෙන විජයබාහු රජුගේ උසස් ගුණාංග

- තුනුරුවනට - පුද සත්කාර
- ගුරුවරුන්ට - උවටැන්
- ධාර්මික ජනයාට - ගෞරවය
- උගතුන්ට - සෞභාග්‍ය
- ඥාතීන්ට - අනුග්‍රහය
- මිතුරන්ට - මිත්‍රත්වය
- සතුරන්ට - පරාජය
- සියලු සතුන්ට - කුළුණු ගුණය
- සභාවට - නුවණ
- තමනට - සම්පූර්ණත්වය



# I වන විජයබාහු රජතුමාගේ මරණින් පසු පොළොන්නරු රාජධානියේ දැකිය හැකි විශේෂ ලක්ෂණ

- පාණ්ඩ්‍ය හා කාලිංග වංශිකයන් අතර රාජ්‍ය උරුමය සඳහා අරගල ඇතිවීම.
- අභ්‍යන්තර ගැටුම් නිසා බලයට පත් වූ පාලකයන් අස්ථාවර වීම.
- රජරට, දක්ඛිණ දේශය හා රුහුණු යනුවෙන් රට කොටස් 3 කට බෙදීයාම.



# මහා පරාක්‍රමබාහු රජතුමා

# මහා පරාක්‍රමබාහු රජතුමාගේ මව්පියන්

පළමු මානාභරණ රජතුමා (පියා)

රත්නාවලී දේවිය (මව)

පරාක්‍රමබාහු කුමාරයා

# පරාක්‍රමබාහු කුමරුගේ කුඩා කාලය

- පරාක්‍රමබාහු කුමරු දක්ඛිණ දේශයේ දැදිගම යන ප්‍රදේශයේ දී උපත ලැබීය.
- කුමරු කුඩා කාලයේදීම පිය රජතුමා වූ මානාභරණ කුමරු මරණයට පත් විය.
- ඉන් පසු රත්නාවලී කුමරිය කුඩා පරාක්‍රමබාහු කුමරු රැගෙන දක්ඛිණ දේශයේ පාලකයා වූ කිත්සිරිමේඝ රජතුමා වෙත ගියේය.

# දැදිගම කොට වෙහෙර



පරාක්‍රමබාහු කුමරු උපන් ස්ථානය සිහිවීම පිණිස ඉදිකළ දැදිගම සූතිඝර දාගැබ

# පරාක්‍රමබාහු කුමරු දක්ඛිණ දේශයේ රජ වීම

- පරාක්‍රමබාහු රජතුමාගේ සුළු පියා වූ කිත්සිරිමේඝ රජතුමාගේ ඇවෑමෙන් පරාක්‍රමබාහු කුමරු දක්ඛිණ දේශයේ පාලකයා විය.
- පරාක්‍රමපුරය යනුවෙන් අභිනව නගරයක් ඉදිකළ මෙතුමා එහි සිට දක්ඛිණ දේශය පාලනය කළේය.
- "අහසින් වැටෙන එක දිය බිඳක්වත් ලෝකෝපකාරයෙන් තොරව මුහුදට ගලා නොයායුතුයි." යන ආදර්ශපාඨය අනුව කටයුතු කරමින් පරාක්‍රමබාහු රජතුමා දක්ඛිණ දේශය ආර්ථික වශයෙන් සමෘද්ධිමත් කළේය.
- පරාක්‍රමබාහු රජතුමා දක්ඛිණ දේශයේ පාලකයාව සිටියදී පොළොන්නරුවේ II ගජබාහු රජතුමා සහ රුහුණේ දෙවන මානාභරණ රජතුමා සමකාලීන පාලකයන් ලෙස කටයුතු කළේය.

# පරාක්‍රමබාහු රජතුමා පොළොන්නරුවේ බලයට පත් වීම

- පොළොන්නරුවේ බලය තහවුරු කරගැනීම සඳහා දක්ඛිණ දේශයේ පාලකයා වූ පරාක්‍රමබාහු රජතුමා, රුහුණේ පාලකයා වූ II වන මානාභරණ සහ පොළොන්නරුවේ II වන ගජබාහු යන පාලකයන් අතර ගැටුම් රැසක් ඇති විය.


- පරාක්‍රමබාහු රජතුමා සහ දෙවන ගජබාහු රජතුමා රුහුණේ දෙවන මානාභරණට එරෙහිව පොදු ගිවිසුමක් ඇති කරගත් අතර එම ගිවිසුම අනුව මුලින් මරණයට පත්වන අයගේ රාජ්‍යය අනෙකා හට හිමිවේ.

- දෙවන ගජබාහු රජතුමාගේ මරණින් පසු දෙවන මානාභරණ රජතුමා පරාක්‍රමබාහු රජතුමා සමඟ ගැටුමක් ඇති කරගත් අතර එම සටනින් පරාජයට පත් වූ මානාභරණ රුහුණට පලාගියේය.

- රුහුණට පලාගිය මානාභරණ රජතුමා කෙටි කලකින් මරණයට පත් වූ අතර ඉන් පසු ඔහුගේ මව වූ සුගලා දේවිය සේනා සංවිධානය කරමින් පරාක්‍රමබාහු රජතුමාට විරුද්ධව අරගල කළ ද ඒවා සාර්ථකව මර්දනය කරමින් රුහුණේ බලය සියතට ගැනීමට පරාක්‍රමබාහු රජතුමාට හැකි විය.

- සුගලා දේවිය සතුව තිබූ දන්ත ධාතුව හා පාත්‍රා ධාතුව තමන් සතු කර ගත් පරාක්‍රමබාහු රජතුමා ක්‍රි.ව 1153 දී ලංකාවම ඒක්සත් කරමින් පොළොන්නරුවේ රජවිය.

# සංගමුව විහාර ලිපිය





සංගමුව විහාර ලිපිය පරාක්‍රමබාහු රජතුමා සහ දෙවන ගජබාහු රජතුමා අතර ඇති වූ ගිවිසුමේ එක් පිටපතකි.

# I වන පරාක්‍රමබාහු රජතුමාගේ ආර්ථික සේවය

- පරාක්‍රමබාහු රජතුමා දැදුරු ඔය “කොට්ට බද්ධ, සූකර නිජ්ජ, දෝරදත්තික” යන ස්ථාන වලින් හරස් කොට අමුණු බඳවා කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබා ගෙන ඇත.
- පස්දුන් කෝරළයේ වගුරුබිම් වල ජලය බස්සවා එම බිම් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ඇත.
- මෙතුමා විසින් මහා වැව් 163 ක්, ගල් සොරොව් 3910 ක්, ඇළමාර්ග 392 ක් ඉදිකිරීම නිසා මෙකල වාරි තාක්ෂණයේ ස්වර්ණමය යුගය ලෙස සැලකේ.
- මෙතුමාගේ විශිෂ්ටතම නිර්මාණය පරාක්‍රම සමුද්‍රයයි.

# පරාක්‍රම සමුද්‍රය



තෝපා සහ දුඹුටුළු යන වැව් දෙක ඒකාබද්ධ කරමින් පරාක්‍රම සමුද්‍රය නිර්මාණය කර ඇත

# I වන පරාක්‍රමබාහු රජතුමාගේ ආගමික සේවය

- තුන් නිකාය සමගි කරවීම.
- පොළොන්නරු කතිකාවත නිර්මාණය කිරීම.
- වෙහෙර විහාර ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම.

# පරාක්‍රමබාහු මාලිගය සහ රාජසභාව



පරාක්‍රමබාහු මාලිගය



පරාක්‍රමබාහු රාජසභාව

# පරාක්‍රමබාහු රජතුමා ඉදිකළ වෙහෙර විහාරස්ථාන



ගල් විහාරය

පොත්ගුල්විහාරය





පොළොන්නරුව
කිරිවෙහෙර


පබළු වෙහෙර



# මහා පරාක්‍රමබාහු රජතුමාගේ විදේශ ප්‍රතිපත්තිය

- අතීතයේ සිට වෙළඳ හා ආගමික කරුණු මුල් කරගනිමින් ශ්‍රී ලංකාව සහ බුරුමය ශක්තිමත් සබඳතා පැවැත්විය.
- පරාක්‍රමබාහු රජතුමාට සමකාලීනව බුරුමය පාලනය කළ අලව්ංසිතු රජතුමා ලංකාවට විරුද්ධ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම නිසා දෙරට අතර සබඳතා පලුදු විය.
- මේ හේතුවෙන් ක්‍රි.ව 1164 දී නගරගිරි කිත්ති සෙනෙවියා යටතේ නාවික හමුදාවක් යවා බුරුමය ආක්‍රමණය කර යටත් කරගැනීමට පරාක්‍රමබාහු රජතුමාට හැකි විය.

# දෙවනගල ශිලා ලිපිය



බුරුම ආක්‍රමණය ජයග්‍රහනයෙන් අවසන් කර දුන් කිත්නුවරගල සෙනවියට මලගොටුව ග්‍රාමය ගම්වරයක් ලෙස ලබාදුන් බව දෙවනගල සෙල්ලිපියේ සඳහන් වේ.

# පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය

- ඉන්දියාවේ පාණ්ඩ්‍ය දේශයේ රාජ්‍යය උරුමය සම්බන්ධයෙන් පරාක්‍රම පාණ්ඩ්‍ය සහ කුලසේකර කුමරු අතර ගැටුමක් ඇති විය.
- පරාක්‍රම පාණ්ඩ්‍ය රජතුමාගේ ඉල්ලීම අනුව I වන පරාක්‍රමබාහු රජතුමා විසින් ලංකාපුර සහ ජගත් විජය යන සෙනවියන් දෙදෙනා යටතේ පාණ්ඩ්‍ය දේශයට සේනාවක් යැවීය.
- මෙම ආක්‍රමණය ජයග්‍රහනය කළේද ? නැද්ද ? යන්න පිළිබඳ උගතුන් අතර ඒකඟතාවයක් නොමැත.

# නිශ්ශංකමල්ල රජතුමා



# නිශ්ශංකමල්ල රජතුමා

- නිශ්ශංකමල්ල රජතුමා කාලිංග වංශිකයෙකි.
- පොළොන්නරුව කාලිංගපුරය ලෙස නම් කර මෙතුමා එහි සිට පාලනය මෙහෙයවා තිබේ.
- මෙතුමා වසර 09 ක් රට පාලනය කර ඇත.
- නිශ්ශංකමල්ල රජතුමාගේ ආධිපත්‍ය රට පුරා ව්‍යාප්ත වූ බව සෙල්ලිපි මඟින් තහවුරු වේ.

# නිශ්ශංකමල්ල රජතුමාගේ මව්පියන්

ජයගෝප මහරජතුමා
(පියා)

පාර්වතී දේවිය
(මව)

නිශ්ශංකමල්ල රජතුමා

# නිශ්ශංකමල්ල රජතුමා මුහුණදුන් අභියෝග

- ඉන්දියාවේ උපන් කාලිංග වංශිකයෙකු වීම.
- පරාක්‍රමබාහු රජතුමාගේ දක්ෂ සෙනවියන් අවනතව තබාගැනීම.
- පාණ්ඩ්‍ය වංශිකයන් බලවත් වීම වළක්වා ගැනීම.
- රුහුණේ තම බලය පවත්වාගෙන යාම.

# නිශ්ශංකමල්ල රජතුමා තමාට මුහුණ දීමට තිබූ අභියෝග ජයගත් ආකාරය

- රට පුරා සංචාරය කරමින් වැසියාගේ සිත දිනා ගැනීම.
- තමාට විරුද්ධ නොවන ලෙස අවවාද කරමින් රටේ විවිධ ප්‍රදේශ වල සෙල්ලිපි පිහිටුවීම.
- පෙරසිටි රජවරුන්ට වඩා ඔහු ශ්‍රේෂ්ඨ රජෙකු බව හුවා දැක්වීම.

# නිශ්ශංකමල්ල රජතුමාගෙන් සිදුවූ සේවාවන්

- රටපුරා සංචාරය කරමින් රටවැසියාගේ සුබසාධන කටයුතු කිරීම.
- තුලාභාර දාන පැවැත්වීම.
- දිළින්දන්ට සහන සැලසීම.
- සොරසතුරු බිය නැති කිරීමට කටයුතු කිරීම.
- පෙර රජවරුන් අයකළ බදු අහෝසි කරමින් බදු සහන ලබාදීම.

උදා - කැති අඩ, සෙහෙන් කටුසර

# නිශ්ශංකමල්ල රජතුමාගේ නිර්මාණ

## රන්කොත් වෙහෙර



## වටදාගෙය



## නිශ්ශංක රාජසභා මණ්ඩපය





## දළදා මැදුර (හැටදාගෙය)

## නිශ්ශංක ලතා මණ්ඩපය



# නිශ්ශංකමල්ල රජතුමා විසින් ලියන ලද ශිලා ලේඛන

## ගල්පොත ලිපිය



## දඹුලු පර්වත ලිපිය



**සවියෙන් පෙරට අපි එකට**
**e- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| **ශ්‍රේණිය** | **විෂයය** | **වාරය** | **පාඩම** |
|---|---|---|---|
| 7 | ඉතිහාසය | 2 | 2. II කොටස<br>අපේ කීර්තිමත් රජවරු - ඇගයීම |

**සැකසුම: තිළිණ වේදගේ**
**වික්‍රමශිලා විද්‍යායතන පිරිවෙන**

- සියලු ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

I කොටස

1. පහත A සහ B ලෙස දක්වා ඇති රූප දෙක නම් කරන්න.





A ..................................................... B ..........................................................

2. මහා විජයබාහු රජතුමා පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර තුනක් නම් කරන්න.
   - ❖ ..................................................................
   - ❖ ..................................................................
   - ❖ ..................................................................
3. කුඩා කාලයේ දී විජයබාහු රජුට රැකවරණය ලබා දුන් අමාත්‍යවරයා නම් කරන්න.
   - ❖ ..........................................................................................................................................
4. මහා විජයබාහු රජතුමාගේ මව සහ පියා නම් කරන්න.
   - ❖ ..................................................................
   - ❖ ..................................................................
5. මහා විජයබාහු රජතුමා කුඩා කාලයේ දී හැඳින්වූයේ කිනම් නමකින්ද ?
   - ❖ ..........................................................................................................................................
6. විජයබාහු රජු විවාහ කරගත් කාලිංග වාංශික කුමාරිකාව නම් කරන්න.
   - ❖ ..........................................................................................................................................

7. අභයගමුව සෙල්ලිපියෙන් හෙළිවන විජයබා රජුගේ උසස් ගුණංග තුනක් නම් කරන්න.

❖ ..................................-.....................................................................................................................................

❖ ..................................-.....................................................................................................................................

❖ ..................................-.....................................................................................................................................

8. විජයබාහු රජුගෙන් සිදු වූ ආගමික සේවාවන් දෙක නම් කරන්න.

❖ ........................................................................................................................................................................

❖ ........................................................................................................................................................................

❖ ........................................................................................................................................................................

## II කොටස

1. පහත A ,B සහ C ලෙස දක්වා ඇති රූප නම් කරන්න.







A ............................................  B ..................................................  C .......................................................

2. මහා පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ ලියවූ ශිලා ලේඛන තුනක් නම් කරන්න.

❖ ..........................................................................  ❖ ..........................................................................

❖ ..........................................................................

3. මහා පරාක්‍රමබාහු රජුගේ දෙමාපියන් නම් කරන්න.

❖ ..........................................................................  ❖ ..........................................................................

4. පරාක්‍රමබාහු රජතුමා උපන් ස්ථානය සිහිවීම සඳහා ඉදිකළ ස්තූපය නම් කරන්න.

❖ .....................................................................................................................................................................

5. පරාක්‍රමබාහු රජු විසින් දැදුරු ඔය හරස්කොට ඉදිකරන ලද අමුණු තුන ලියා දක්වන්න.

❖ ..........................................................................

❖ ..........................................................................  ❖ ...................................................................

6. තෝපා සහ දුඹුටුළු යන වැව් ඒ්කාබද්ධ කරමින් පරාක්‍රමබාහු රජු ඉදිකරන ලද වැව කුමක්ද ?

❖ .....................................................................................................................................................................

7. පරාක්‍රමබාහු රජු ඉදිකරන ලද ස්ථූප දෙකක් නම් කරන්න.

❖ ........................................................................ ❖ ........................................................................

8. මහා පරාක්‍රමබාහු රජතුමාගේ බුරුම ආක්‍රමණය සහ පාණ්ඩ්‍ය දේශ ආක්‍රමණය මෙහෙය වූ ප්‍රධාන සෙනවියන් නම් කරන්න.

❖ බුරුම ආක්‍රමණය - ..........................................................................................................

❖ පාණ්ඩ්‍ය දේශ ආක්‍රමණය - ..........................................................................................................

9. පළමු පරාක්‍රමබාහු රජුගෙන් සිදු වූ ආගමික සේවාවන් තුනක් ලියා දක්වන්න.

❖ ..........................................................................................................................................

❖ ..........................................................................................................................................

❖ ..........................................................................................................................................

10. පළමු පරාක්‍රමබාහු රජු දක්ඛිණ දේශය සංවර්ධනය කිරීමේදී අනුගමනය කරන ලද ආදර්ශපාඨය ලියා දක්වන්න.

"..........................................................................................................................................

.........................................................................................................................................."

## III කොටස

1. පහත A ලෙස දක්වා ඇති රූපය නම්කරන්න.



A ..........................................................................................................................................

2. නිශ්ශංකමල්ල රජතුමා විසින් ලියවූ ශිලා ලේඛන කිහිපයක් නම් කරන්න.

❖ ........................................................................ ❖ ........................................................................

3. නිශ්ශංකමල්ල රජතුමාගේ දෙමාපියන් නම් කරන්න.

❖ ........................................................................ ❖ ........................................................................

4. නිශ්ශංකමල්ල රජතුමා කිනම් වංශිකයෙක්ද ?

❖ ..........................................................................................................................................

5. නිශ්ශංකමල්ල රජුගෙන් සිදු වූ සේවාවන් කිහිපයක් ලියා දක්වන්න.

- ❖ ..........................................................................................................................................................
- ❖ ..........................................................................................................................................................
- ❖ ..........................................................................................................................................................
- ❖ .........................................................................................................................................................

6. තුළාභාර දානය හඳුන්වන්න.

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

7. නිශ්ශංකමල්ල රජු ඉදිකරන ලද ස්තූපයක් නම් කරන්න.

- ❖ ..........................................................................................................................................................

8. නිශ්ශංකමල්ල රජු මුහුණදුන් අභියෝග දෙකක් ලියා දක්වන්න.

- ❖ ..........................................................................................................................................................
- ❖ ..........................................................................................................................................................
- ❖ .........................................................................................................................................................


**සවියෙන් පෙරට අපි එකට**
**e- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| **ශ්‍රේණිය** | **විෂයය** | **වාරය** | **පාඩම** |
|---|---|---|---|
| 7 | **ඉතිහාසය** | **2** | **2. II කොටස**<br>**අපේ කීර්තිමත් රජවරු - පිළිතුරු** |

**සැකසුම: තිළිණ වෙදගේ**
**වික්‍රමශිලා විද්‍යායතන පිරිවෙන**

I කොටස

1.



A පනාකඩුව තඹ සන්නස



B විජයබාහු රජු අනුරාධපුරයේ ඉදිකළ මාලිගය

2. චූලවංශය

අඹගමුව ශිලා ලේඛනය

පනාකඩුව තඹ සන්නස

3. සිත්නරු බිම් බුදල්නා (බුද්ධරාජ)
4. පියා-මහාසාමි මොග්ගල්ලාන

මව- ලෝකිතා දේවිය

5. කිත්ති කුමරු
6. තිලෝක සුන්දරි කුමාරිකාව
7.
   - තුණුරුවන්ට - පුද සත්කාර
   - ගුරුවරුන්ට - උවටැන්
   - මිතුරන්ට - මිත්‍රත්වය
8.
   - බුරුමයෙන් උපසම්පදා භික්ෂූන් වැඩමකර ලක්දිව උපසම්පදාව නැවත පිහිටුවීම
   - පොළොන්නරුවේ දළදා මාලිගයක් නිර්මාණය කිරීම
   - අනුරාධපුරයේ සහ රුහුණේ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම

II කොටස

1.








A පරාක්‍රමබාහු රජ මාලිගය B පරාක්‍රමබාහු රජුගේ රාජසභාව C ගල්විහාරයේ හිටි පිළිමය

2.

- ❖ දෙවනගල ශිලාලේඛනය
- ❖ සංගමුව විහාර ලිපිය
- ❖ පොළොන්නරු කථිකාවත

3. පියා-පළමු මානාභරණ කුමරු මව-රත්නාවලී දේවිය

4. දැදිගම කොට වෙහෙර (සූතිඝර දාගැබ)

5. කොට්ට බද්ධ, සූකර නිජ්ජ, දෝරදත්තික

6. පරාක්‍රම සමුද්‍රය

7. පොළොන්නරුවෙ කිරිවෙහෙර, පබළු වෙහෙර

8. බුරුම ආක්‍රමණය - නගරගිරි කිත්ති සෙනවිය

පාණ්ඩ්‍ය දේශ ආක්‍රමණය- ලංකා පුර සහ ජගත් විජය

9.

- ❖ තුන් නිකාය සමගි කිරීම
- ❖ පොළොන්නරු කතිකාවත නිර්මාණය කිරීම
- ❖ වෙහෙරවිහාර ඉදිකිරීම

10. “අහසින් වැටෙන එක දිය බිඳක්වත් මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා නොයායුතුයි”

III කොටස

1.



A නිශ්ශංකමල්ල රජුගේ රාජසභාව

2. ගල්පොත ශිලාලේඛනය, දඹුලු පර්වත ලිපිය

3. පියා- ජයගෝප මහරජු මව-පාර්වති දේවිය

4. නිශ්ශංකමල්ල රජතුමා කිනම් වංශිකයෙක්ද ?

❖ කාලිංග වංශිකයෙකි

5. තුළාභාර දාන පැවැත්වීම, දිළින්දන්ට සහන සැලසීම, සොරසතුරු බිය නැතිකිරීම, පෙර රජවරුන් විසින් අයකරන ලද බදු අහෝසි කරමින් බදු සහන ලබාදීම

6. තුළාභාර දානය යනු යම් තැනැත්තෙකුගේ බරට සමානව වස්තුව දන් දීමයි

7. රන්කොත් වෙහෙර

8.

❖ පරාක්‍රමබාහු රජුගේ දක්ෂ සෙනවියන් අවනතව තබාගැනීම

❖ පාණ්ඩ්‍ය වංශිකයන් බලවත්වීම වලක්වා ගැනීම

❖ රුහුණේ තම බලය පවත්වාගෙනයාම